දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. } ..............................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.

"இசுருபாயா"
பத்தரமுல்ல.

"Isurupaya"
Battaramulla.

පාසල් කටයුතු හා පෞද්ගලික පාසල්
ඊඩී /01/12/01/07/01

මගේ අංකය / எமது இல. / My No. } ..............................

දිනය / திகதி / Date } 2005.03.17

චක්‍රලේඛ අංක :- 2005/08

සියළුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියළුම ජාතික පාසල් විදුහල්පතිවරුන් වෙත

## 5 වෙනි ශ්‍රේණියේ ශිෂ්‍යාධාර හා පාසල් ලබාදීම සඳහා පැවත්වෙන ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල මත ප්‍රධානය කෙරෙන ශිෂ්‍යාධාර දීමනා ක්‍රමය සංශෝධනය කිරීම

1989.නොවැම්බර් මස.08 වන දිනැති අංක /2/පාස 4/241 දරණ ලිපිය මගින් පාසල් තුල 6 වන ශ්‍රේණියේ සිට 13 වන ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන සිසුන් සඳහා 1983 වර්ෂයේ සිට ගෙවන ලද රු.1000ක් වූ වාර්ෂික ශිෂ්‍යාධාර දීමනාව 1989 ජූලි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එක් වර්ෂයක මාස 10 ක කාල සීමාවක් දක්වා රු. 2400 දක්වා වැඩි කරනු ලැබ ඇත. එහෙත් 1989 ජූලි මාසයේ සිට ගෙවනු ලබන මෙම දීමනාව වර්තමාන සමාජ ආර්ථික තත්වයනට නොගැලපෙන හෙයින් මෙම මුදල වැඩිකරන ලෙසට ඉල්ලීම් රාශියක් ඉදිරිපත්වී ඇත.

මේ සම්බන්ධ වූ ඉල්ලීම් සැලකිල්ලට ගනු ලැබූ ගරු අධ්‍යාපන ඇමතිතුමිය විසින් දැනට 5 වෙනි ශ්‍රේණි ශිෂ්‍යත්වධාරිනට දැනට එක් වර්ෂයක මාස 10 ක් සඳහා ගෙවනු ලබන රු.2400 ක ශිෂ්‍යාධාර දීමනාව එම කාලය සඳහා රු.5000 බැගින් වැඩිකර ගෙවීම සඳහා ඇමති මණ්ඩලය වෙත යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබ ඇත. 2004.09.15 දිනැති අංක 04/1183/035/038 වූ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් ඉදිරිපත් කරන ලද මෙම යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් 2004.09.29 වන දින අනුමැතිය ලබාදී ඇත.

ඒ අනුව 2005 වර්ෂයේ 6 වන ශ්‍රේණියට ඇතුලත්වන ශිෂ්‍යත්වධාරින් ද ඇතුලත්ව දැනට 13 වන ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවල ඉගෙනුම ලබන 5 වන ශ්‍රේණි ශිෂ්‍යත්වධාරින් සඳහා මාසිකව ගෙවනු ලබන රු.240ක් වූ ශිෂ්‍යාධාර ප්‍රමාණය රු.500 දක්වා එමගින් වැඩි කරනු ලැබ ඇත.

ඒ අනුව දැනට එක් වර්ෂයක මාස 10 ක කාල සීමාවක් සඳහා ගෙවනු ලබන රු.2400ක මුදල 2005 ජනවාරි මාසයේ සිට රු.5000. දක්වා වැඩිවනු ඇත.

මෙම වැඩිවීම අනුව 2005 ජනවාරි මාසයේ 01 වන දින සිට ශිෂ්‍යත්වධාරින් සඳහා මාසිකව රු.500 බැගින් ගෙවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

තවද මෙම ශිෂ්‍යාධාර ගෙවනු ලැබිය යුතුවන්නේ ඔබ වෙත සපයා ඇති අඩු ආදායම්ලාභී නාම ලේඛණයේ නම සඳහන් සිසුන් සඳහා පමණකි. වාර්ෂික ආදායම් සීමාව 2002.08.15 දිනැති 2002/20 හා 2004.04.27 දිනැති 2004/15 දරණ චක්‍ර ලේඛ මගින් රු.24000 දක්වා වැඩි කරනු ලැබ ඇත.

වෛද්‍ය තාරා ද මෙල්
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්.1 සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
2.සියලුම කලාප අධ්‍යාපන ගණකාධිකාරීවරුන්
3.සියලුම කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

C:\Documents and Settings\Administrator.PMO\My Documents\circular.doc